චක්‍රලේඛ අංක : 02/2024

WPCEC/MA 01/ චක්‍රලේඛ
සමූපකාර සේවක කොමිෂන් සභාව (බ.ප.),
අංක 628 , ජනජය සිටි ගොඩනැගිල්ල,
8 වන මහල , නාවල පාර , රාජගිරිය.
2024.01. 22

බස්නාහිර පළාතේ,
සියළුම වි.සේ.ස. සමිති, දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගම්, සමූපකාර ණය දෙන සමිති,
දිස්ත්‍රික් සමූපකාර මණ්ඩල හා අනෙකුත් සියළුම ලියාපදිංචි සමූපකාර සමිති
සභාපතිවරුන් වෙත.

<u>රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2024 ට සමගාමීව සමූපකාර සේවකයින් සඳහා මාසික දීමනාවක් ගෙවීම.</u>

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2024 යටතේ රාජ්‍ය සේවකයින්ට ලබා දුන් රු: 10000/= ක මාසික දීමනාවට සමගාමීව බස්නාහිර පලාත් සමූපකාර සේවකයන් වෙතද මූලික වැටුපට එකතු නොවන පරිදි මාසික දීමනාවක් ගෙවීම කෙරෙහි කොමිෂන් සභාවේ අවධානය යොමු විය.

02. ඒ අනුව සමූපකාර සමිති , පහත ක්‍රමවේද 03 න් අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරනු ලබන එක් ක්‍රමවේදයක් පමණක් අනුගමනය කරමින් සේවකයෙකුට ගෙවිය යුතු මාසික දීමානාව සමිතියේ ආර්ථික ශක්‍යතාවය අනුව රු. 3000.00 හෝ රු. 5000.00 හෝ රු. 10000.00 හෝ වන පරිදි සමිතියේ සියළුම සේවකයන්ට එක සමාන ලෙස 2024 ජනවාරි මස සිට ලබා දිය යුතු වේ. මෙම දීමනාව ගෙවීමේ දී 2024 ජනවාරි සිට මාර්තු දක්වා සමිති විසින් නිශ්චය කරනු ලබන දීමනා මුදලින් හරි අඩක් ලබා දිය යුතු වන අතර නිශ්චය කරනු ලබන සම්පූර්ණ දීමනාව 2024 අප්‍රේල් මස සිට ලබා දීමට කටයුතු කල යුතු වේ. 2024 ජනවාරි සිට මාර්තු දක්වා ලබා දිය යුතු හිඟ දීමනාව 2025 ජනවාරි සිට මාර්තු දක්වා වාරික 03 කින් ලබා දීමට කටයුතු කල යුතු වේ.

I. සම්පූර්ණ දීමනාව මුදලින් ගෙවීම
II. සම්පූර්ණ දීමනාව පාරිභෝගික භාණ්ඩ වලින් ගෙවීම
III. පාරිභෝගික භාණ්ඩ වලින් 50% ක් හා මුදලින් 50% ක් වන පරිදි ගෙවීම

03. මෙම දීමනාව ලබා ගැනීමට පිරිස්බල තක්සේරුවේ සඳහන් තනතුරක සේවය කරනු ලබන ස්ථිර, තාවකාලික හා කොන්ත්‍රාත් මෙන්ම දෛනික වැටුප් ලබන සේවකයන් සුදුසුකම් ලබයි.

04. වැටුප් රහිත නිවාඩු ලබා සිටින සේවකයන් හට මෙම දීමනාව සඳහා හිමිකමක් නොමැත. අඩ වැටුප් නිවාඩු ලබා සිටින සේවකයන් හට හිමිවනුයේ මෙම දීමනාවෙන් අඩකි.

05. දෛනික වැටුප් ලබන තැනැත්තන් සඳහා සේවයට වාර්තා කල යුතු සම්පූර්ණ දින ගණන ම සේවයට වාර්තා කර ඇත්නම් සම්පූර්ණ දීමනාව ගෙවිය යුතු අතර, එසේ සේවයට වාර්තා කර නොමැති නම් සේවයට වාර්තා කල දින ගණනට අනුපාතිකව දීමනාව ගෙවිය යුතුය.

06. මෙම දීමනා ගෙවීමට ප්‍රතිපාදන සපයා ගැනීමට අපොහොසත් වන සමූපකාර සමිති සිය ආදායම් අනුව සුදුසු විකල්ප ක්‍රියාමාර්ගයකින් ප්‍රතිපාදන සපයා ගැනීමට කටයුතු කළ යුතුය.

07. මෙම දීමනාව විශ්‍රාම පාරිතෝෂිකය ගණනය කිරීමේදී , සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට දායක වීම සම්බන්ධයෙන්ද වන කල්හී, අදාළ කර නොගත යුතුය

කොමිෂන් සභා නියමය පරිදි

එස්.ජේ.ජයසිංහ
ලේකම්
සමූපකාර සේවක කොමිෂන් සභාව
බස්නාහිර පළාත

පිටපත් : 1. ලේකම්, පළාත් මාර්ග ප්‍රවාහන සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය (බ.ප.) - කා.දැ.ගැ.පි.
2. සමූපකාර සංවර්ධන කොමසාරිස් හා සමිති රෙජිස්ට්‍රාර් (බ.ප.) - කා.දැ.ගැ.පි.